# තේ තතු

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි


පස්වන කාණ්ඩය පළමුවන කලාපය 2005

ISSN - 1391- 6785

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA


## එදා සහ මෙදා .. කුඩා තේ වතු..

ඒ 1932 වසර ය. තේ පර්යේෂණායතන මණ්ඩලය එම වසරේ ජූලි මස 28 වෙනි දින පැවැත් වූ රැස්වීමේදී කුඩා තේ වතු සම්බන්ධව කටයුතු කිරීම සඳහා විශේෂ නිලධාරියෙකු පත් කිරීමත් සමඟ ම දිවයිනේ එවකට ආරම්භ වෙමින් පැවැති කුඩා තේ ඉඩම් සඳහා රාජ්‍ය ආයතනික මැදිහත් වීමේ ආරම්භය සනිටුහන් විය. උඩ පලාත ප්‍රදේශයෙන් බද්දට ගත් අක්කර 10 ක ඉඩමක නිදර්ශක තේ වගාවන් ආරම්භ කිරීම එම නිලධාරියාට පැවරුනු මුල් ම රාජකාරිය විය.




1932 අප්‍රේල් සහ මැයි මාස වලදී තේ පර්යේෂණායතනය මගින් පැවැත් වූ කුඩා තේ වතු පිලිබඳ සමීක්ෂණයක ප්‍රතිඵල තේ පර්යේෂණ මණ්ඩලය, කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් මෙම පියවර ගැනීමට පෙලඹ වූ බව නොරහසකි.

එදා කුඩා තේ වතු හිමියන් වැඩි පිරිසක් ඒකරාශි වී සිටි මහනුවර දිස්ත්‍රික්කය පදනම් කර ගෙන මෙම සමීක්ෂණය පැවැත්වූ අතර දිවයිනේ අනෙකුත් ප්‍රදේශ වලින් ද තොරතුරු රැස්කල බවට වාර්තා වේ.

මෙම සමීක්ෂණයෙන් ලබාගත් තොරතුරු පහත සඳහන් පරිදි සංක්ෂිප්ත ව දැක්විය හැක.

බොහෝ විට කුඩා තේ වතු හිමියන් කෘෂිකාර්මික කටයුතු වල නියුක්ත වූ ගැමියන් වූ අතර ඔවුනට වෙනත් වගා ඉඩම්, විශේෂයෙන් කුඹුරු ඉඩම් ද තිබුනි.



බොහෝ කුඩා තේ වතු හිමියන් තමන්ම තම ඉඩමේ වගා කටයුතු කල අතර සමහර ප්‍රධාන වගා කටයුතු සඳහා කම්කරුවන් කොන්ත්‍රාත් පදනමින් යොදා ගත් බොහෝ අවස්ථා දැකිය හැකි විය.

අවට ඇති විශාල වතුවල වැඩ කරන කුඩා තේ වතු හිමියන් හෝ විශාල වතු වලින් කුලියට යොදාගත් කම්කරුවන් තේ වගා කටයුතු පිලිබඳ දැනුම ගමට ගෙන එන ප්‍රධාන ම මාර්ගය විය. නමුත් කුඩා තේ වතු හිමියන් ප්‍රධාන වශයෙන් ආර්ථික කරුණු නිසා විශාල වතුවල අනුගමනය කරන සියළුම වගා කටයුතු තම ඉඩම් වල යොදා නොගත් බව පෙනේ.



බොහෝ විට දළු කැඩීම කරන ලද්දේ කුලී කම්කරුවන් විසින් වන අතර ඔවුනට අමුදළු රාත්තලකට ශත 1-2 අතර ප්‍රමාණයක් ගෙවන ලදි. දළු නෙලීමේදී දළුවල තත්වය පිලිබඳ ඉතාමත් සැලකිලිමත් වූ අතර හොඳ දළු රාත්තලකට සත 3 ක පමණ මුදලක් ගෙවන ලදි. කෙසේ නමුත් කුඩා තේ වතු හිමියන්ගේ නිරන්තර මැසිවිල්ල වූයේ කම්කරුවන් ලවා හොඳ දළු ලබා ගැනීමට අපහසු බවයි. ඊට ප්‍රධාන ම හේතුව වූයේ දළු නෙලන්නියකට දළු බරට කුලිය ගෙවන නිසා ඔවුන් හැකි තරම් දළු නෙලීමට පෙලඹුන නිසා ය.

| දිස්ත්‍රික්ක | මුළු අක් ගණන | කුඩා තේ ඉඩම් ප්‍රමාණය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | මුළු කැබලි ගණන | අක්. 10 ට අඩු | අක් 1 - 5 අතර | අක් 5-10 අතර | අක් 10-20 අතර | අක්කර 20-50 අතර | අක්.50 වැඩි |
| මහනුවර | 6260 | 3555 | 1502 | 1711 | 212 | 84 | 41 | 05 |
| මාතලේ | 680 | 211 | 95 | 82 | 20 | 12 | 02 | |
| නුවරඑළිය | 2927 | 787 | 336 | 307 | 92 | 35 | 15 | 02 |
| ඌව | 7246 | 1369 | 550 | 563 | 130 | 64 | 39 | 23 |
| ගාල්ල | 3591 | 647 | 249 | 245 | 60 | 47 | 40 | 06 |
| මාතර | 4565 | 447 | 169 | 136 | 56 | 38 | 30 | 18 |
| රත්නපුර | 2130 | 259 | 72 | 107 | 37 | 16 | 20 | 07 |
| කෑගල්ල | 712 | 82 | 10 | 30 | 21 | 17 | 03 | 01 |
| එකතුව | 31549 | 7357 | 2983 | 3181 | 628 | 313 | 190 | 62 |

එදා කුඩා තේ වතු ඉඩම් විවිධ දිස්ත්‍රික්ක තුල පැතිර තිබූ අන්දම

අක්‍රමවත් දළු රැවුම් බොහෝ විට දැකිය හැකි විය. බොහෝ විට එය මාසයකට 2-3 වතාවක් පමණ විය. වියලි කාල වලදී විශාල වතු වල දළු නෙලන්නියන්ට නෙලන දළු ප්‍රමාණය කොපමණ වුවද දිනකට අවම කුලියක් ගෙවනු ලැබුවද කුඩා තේ වතුවල ගෙවීම කරන ලද්දේ දළු බරටම නිසා වියලි කාල වලදී තේ පඳුරු අධික ලෙස සූරා නෙලීමකට භාජනය විය.

කප්පාදු කිරීම බොහෝ විට අක්‍රමවත් කාල පරාසයක් ඇති ව සිදුවිය. බොහෝ විට දළු නෙලීම අපහසු වූ විට හෝ දළු අස්වැන්න ඉතාමත් පහල ගිය විට කප්පාදු කිරීමට තීරණය කරනු ලැබීය. සාමාන්‍යයෙන් දිනකට කම්කරුවෙකුට ගස් 100 ක් කප්පාදු කිරීම සඳහා ශත 25 ක මුදලක් ගෙවන ලදි.

වල් නෙලීම බොහෝ විට සිදු කරන ලද්දේ වල් ඉතාමත් ඝනව වැඩුනු විටය. බොහෝ විට අක්කරයට රු 1.00 - 3.00 අතර ප්‍රමාණයකට කොන්ත්‍රාත් දීම මගින් වල් පාලනය කල බව වාර්තාවේ. බොහෝ විට වල් පාලනය කරනු ලැබුවේ සොරඩි වලින් හෝ උදළු වලිනි.

ඉඩම් වලට කොල පොහොර එක් කිරීම බොහෝ විට සිදු කර ඇති බව පෙනේ. කප්පාදු අතු වැලලීම ඉතාමත් හොඳ කටයුත්තක් ලෙස කුඩා තේ වතු හිමියන් සැලකූ අතර බොහෝවිට අමු දළු වලට හොඳ මිලක් ලැබෙන කාලවල දී කප්පාදු අතු වැලලීම සඳහා ඔවුන් කටයුතු කර ඇති බව පෙනේ. සාමාන්‍යයෙන් අක්කරයකට ඒ සඳහා රුපියල් 10/= පමණ වැය වූ බව වාර්තාවේ.

කුඩා තේ වතු වල රසායනික පොහොර යෙදුවේ ඉතාමත් කලාතුරකිනි. මෙයට ප්‍රධාන හේතුව වූයේ එය අධික වියදම් සහිත වීමය. පස මුල්ලු කිරීම සිදුවූයේ ද ඉතාමත් කලාතුරකිනි.

සාමාන්‍යයෙන් කුඩා තේ ඉඩම් වලින් රෝග සහ පලිබෝධ ගැටළු වාර්තා නොවීම විශේෂ කරුණක් ලෙස සඳහන් කල හැක. මේ කාලය වන විට මැදරට ප්‍රදේශයේ තේ වතුවල කඳ ගුල්ලාගේ හානිය ගැටළු සහගත තත්වයක් ලෙස වාර්තා වී තිබුනත් කුඩා තේ ඉඩම් වලින් මෙම ගැටළුව වාර්තා නොවීම සැලකිල්ලට ගතයුතු කරුණකි.

කුඩා තේ වතු හිමියන්ගේ වාර්තා තබා ගැනීම ඉතාමත් දුර්වල තත්වයක පැවති බැවින් තේ අස්වැන්න පිලිබඳ නිවැරදි තොරතුරු ලබාගැනීම අපහසු වූවද මේ කාලයේ සාමාන්‍යයෙන් අක්කරයකින් වසරකට නිමි තේ රාත්තල් 400 පමණ ලබා ගෙන ඇති බව පෙනේ.

මෙවන් ආරම්භයක් සහිත ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු ක්ෂේත්‍රය වසරකට හෙක්ටයාරයකින් නිමි තේ කිලෝ ග්‍රෑම් 2300 (වසරකට අක්කරයකින් නිමි තේ රාත්තල් 2050) ක පමණ සාමාන්‍ය ඵලදාවක් ලබා දෙන එමෙන් ම ජාතික තේ නිෂ්පාදනයට 62% ක පමණ දායකත්වයක් සපයන තත්වයක් කරා දියුණු වීම කුඩා තේ වතු හිමියන්ගේ වගා කටයුතු වෙනුවෙන් ඉමහත් කැපවීමකින් සහ වගකීමකින් යුතුව වැඩ කටයුතු කරන කුඩා තේ වතු සංවර්ධන අධිකාරියටත්, නව දැනුමෙන්, නව තාක්ෂණයෙන් ඔවුන්ව පෝෂණය කිරීමේ සද්කාර්යයට කැපවීමෙන් කටයුතු කරන තේ පර්යේෂණායතනයටත්, අනෙකුත් අදාල ආයතනවලටත් සතුටු විය හැකි කරුණකි.

මෙතැනින් නොනැවතී දිවයිනේ වගාකරන සෑම රිකිලි තේ ඉඩමක ම හෙක්ටයාරයකින් අවම වශයෙන් නිමි තේ කි.ග්‍රෑම් 3000 ක ඉලක්කයක් කරා ඉක්මණින් ළඟා වීමට අප සියළු දෙනාම එක්වී කුඩා තේ වතු හිමියන්ට මඟ පෙන්වීමත්, සහයෝගය ලබා දීමත් කල යුතුය.


(ආශ්‍රිත ලිපි සහ වාර්තා: Small-Holdings in Tea, G.H. Gadd, TRI Annual Report 1932, TRI Annual Reports, 1932, 1934)



බී.ඒ.ඩී.සමන්සිරි, අංශ ප්‍රධානි, උපදෙස් සහ ව්‍යාප්ති අංශය,